චක්‍රලේඛ අංක - 02/2012 (1)

මගේ අංකය- බප/සසේකො/ලේ.නිර්/2012
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
121/3, කිරුළපන මාවත,
කොළඹ 05.
2012.04. 30

බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
ස.ණ.ස. සමිතිවල
සභාපතිවරුන් වෙත.

**බස්නාහිර පළාත් සමුපකාර සමිති වල සේවයේ නියුතු බර වාහන රියදුරන් හා කම්කරුවන් සඳහා විශේෂ දීමනාවක් ගෙවීම.**

බස්නාහිර පළාතේ සමුපකාර සමිති වල සේවයේ නියුක්තව සිටින ස්ථිර, තාවකාලික හා අනියම් බර වාහන රියදුරන්, සැහැල්ලු වාහන රියදුරන් , රිය සහායකයින්, තොග ගබඩා කම්කරුවන් සඳහා පහත දැක්වෙන විධිවිධාන අනුව විශේෂ දීමනාවක් ගෙවීමට සමුපකාර සේවක කොමිෂන් සභාව අනුමත කර ඇති බව නියමය පරිදි දන්වමි.

02. (1) බර වාහන රියදුරන් සඳහා මසකට රු. 5000/- ක්ද, සැහැල්ලු වාහන රියදුරන් සඳහා රු. 3000/- ක්ද, රිය සහායක, තොග ගබඩා කම්කරුවන් සඳහා මසකට රු. 5000/- ක දීමනාවක්ද 2012 අප්‍රේල් මස සිට ගෙවීමට කටයුතු කල යුතුය.

(11) ඉහත විශේෂ මාසික දීමනාව ලැබීමට සතියට දින 05 ක් වැඩ කරන සමිති අවම වශයෙන් වැඩ කරන දින 20 න් දින 17 ක්ද සතියට දින 06 ක් වැඩ කරන සමිති අවම වශයෙන් වැඩ කරන දින 26 න් දින 22 ක්ද සේවය කරතිබීම අනිවාර්ය වන අතර නියම කර ඇති නියමිත දින ගණන අඩු වූ විට මෙම දීමනාව හිමි නොවේ.

(111) මෙම විශේෂ මාසික දීමනාව ගෙවීම හෝ නොගෙවීම සමිතියේ ආර්ථික ශක්‍යතාවය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කල යුතු වේ.

(1v) බර වාහන රියදුරන් සඳහා දීමනාව ලබා ගැනීමට වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීමත් සමිතියේ බර වාහනයක රියදුරෙකු ලෙස කටයුතු කිරීමත් සැහැල්ලු වාහන රියදුරන් සඳහා මෙම දීමනාව ලබා ගැනීමට වලංගු සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රයක් හෝ බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීමත් සමිතියේ සැහැල්ලු වාහනයක රියදුරෙකු ලෙස කටයුතු කිරීමත් අවශ්‍ය වේ.

(v) මෙම රියදුරු දීමනාව මූලික වැටුපට එකතු නොවේ.

(vi) මෙම විශේෂ මාසික දීමනාව විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ගණනය කිරීමේදී අදාල නොවිය යුතු අතර සේවක අර්ථ සාධක අරමුදල් , සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල් සම්බන්ධයෙන් වන කල්හි එම කම්කරු නීතිරීතීන් වලට අනුව කටයුතු කල යුතු වේ.

(vii) යම් සමිතියකට විශේෂ වනසේ මීට පෙර බර වාහන රියදුරන්, සැහැල්ලු වාහන රියදුරන්, රිය සහායකයින්, තොග ගබඩා කම්කරුවන් සඳහා විශේෂ දීමනාවක් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇතිනම් මෙම චක්‍රලේඛය නිකුත් වීමත් සමඟ එවැනි සියලු දීමනා අවලංගු වේ.

(viii) 2012-03-12 දින නිකුත් කරන ලද අංක 2/2012 බස්නාහිර පළාත් සමුපකාර කොමිෂන් සභා චක්‍රලේඛය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරනු ලැබේ.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

අයි.ආර්. සෝමසිරි,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් -

1. බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්
3. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය
4. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වෘත්තිය සමිති සංගම්